චක්‍රලේඛ අංකය-08/2023

මගේ අංකය /1/මෙ/සමු -CCD/01
සමුපකාරසංවර්ධනදෙපාර්තමේන්තුව,(.ප.බ)
ආදිපාද වීදිය,
කොළඹ 01
2023.03 27

සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය / බස්නාහිර පළාත් විවිධ සේවා සමුපකාර සමිති /ද්විතීක සංගම්/ සමිතිවල සභාපතිවරුන් වෙත.

සභාපතිවරුන්/අධ්‍යක්ෂකවරුන්/ කාරක සභාවල සභාපතිවරුන්/ සභිකයන් සඳහා දීමනා ගෙවීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කර ඇති 2019/06 චක්‍රලේඛනය අනුව සමිතියේ සමස්ථ ව්‍යාපාරික අංශ මාසික පොදු ලාභලාභ ගිණුමේ ශුද්ධ අතිරික්තය/ඌනතාවය මත සමිතියේ සභාපතිවරුන්ට හා උපසභාපතිවරුන්ට දීමනා ගෙවීමට ප්‍රතිපාදන සලසා ඇත. සමස්ථ සමිතියේ මාසික පොදු ලාභලාභ ගිණුමේ ශුද්ධ අතිරික්තය/ඌනතාවය මත දීමනා ගෙවීමේදි සමිතියේ එක් අංශයක හෝ අංශයේ එක් එක් ඒකකයක ලාභය නිරික්ෂණය නොවන බැවින්, සමස්ථ සමිතියේ සියළු අංශ වල එක් එක් අනු ඒකක සියල්ල දියුණු කිරීමට අවධානය අඩුවීම නිරික්ෂණය කරමි.

02. සමිතියේ සමස්ථ ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චිත කාර්යභාරයක් ඉටුකිරිම සඳහා යොමු කරවීමත්, එමගින් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව හා ඵලදායිව සමිතියට ලබාගැනීම අපේක්ෂා කරන අතර, සමිතියේ කටයුතු දිනෙන් දින දියුණු මට්ටමකට ගෙන ඒමටත් එමගින් බස්නාහිර පළාත තුල සමුපකාර පද්ධතිය නැවුම් මුහුණුවරකින් ක්‍රියාත්මක කරවීමට සක්‍රිය දායකත්වය ලබාගැනීම අපේක්ෂා කරමි. ඒ අනුව බස්නාහිර පළාතේ 2011 අංක 04 දරණ සමුපකාර සමිති(සංශෝධිත) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සම්පාදිත හෝ පිළිගත් හෝ සමුපකාර සමිති රීති වලින් බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පැවරි ඇති බලතල යටතේ පහත සඳහන් තීරණය ගනිමි.

03. ඒ අනුව සමිතියේ සියලු අංශවල එක් එක් එකකයන් දියුණු කරමින් සමුපකාර සමිතියක් සතු එක් එක් අංශ දියුණු කරමින් සමස්ත සමුපකාරය සමිතිය ලාභදායිව පවත්වා ගැනීම අරමුණු කරගනිමින් ඉලක්කගත දිමනා ක්‍රමයක් සකස් කිරිමට අවධානය යොමු කරන ලදි.

04. ඒ අනුව මගේ අංක සමු/මෙ/3/1 හා 2019.04.22 දිනැති 2019/06 චක්‍රලේඛයේ අනු අංක 1 සිට 8 දක්වා වගන්ති මෙයින් අවලංගු කරන අතර 2023.10.01 දින සිට මෙම චක්‍ර ලේඛනයේ විධිවිධාන ක්‍රියාත්මක වන බවත් සමිතියේ ක්‍රියාත්මක ව්‍යාපාරික අංශවල මාසික ශුද්ධ ප්‍රතිඵලය අනුව පහත සඳහන් පරිදි දීමනා ලබා ගැනීමට අනුමත කරමි.

05. සමිතියේ මහා සභාවෙන් හෝ මහා සභාව විසින් පත් කර ගන්නා අධ්‍යක්ෂක මණ්ඩලයට මාසික දීමනාව පහත සඳහන් ආකාරයට මිස වෙනත් ආකාරයකින් ලබා නොගත යුතුය. එලෙස තෝරා ගන්නා ධුරධාරින් රජයේ නිලධාරියෙකු නම් අදාල දීමනාවෙන් 10% ක් අඩුකර රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සමිතියේ වගකීම වන්නේය. එහි සාරාංශ සටහනක් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට එවිය යුතුය.

05. විවිධ සේවා සමුපකාර සමිති සඳහා පහත පරිදි දීමනාවන් ගෙවීම අනුමත කරමි.

05. 1.1.සමිතියේ ග්‍රාමීය බැංකු අංශය

I. සමිතිය සතු සියළු බැංකු ශාඛා වෙන් වෙන්ව ශුද්ධ ලාභදායි වන අවස්ථාවකදී, එක් එක් බැංකු ශාඛාවේ මාසික ශුද්ධ ලාභයෙන් 10% ප්‍රතිශතයෙන් සභාපතිවරයාට 50%ක්ද, උපසභාපතිවරයාට 20%ක්ද , අධ්‍යක්ෂ මණ්ඩල අනෙකුත් සමාජිකයින්ට 30% ක්ද ලබාගැනීමට හැකිය .

II. බැංකු ශාඛා කිහිපයක් ලාභදායි වන අවස්ථාවක හා තවත් බැංකු ශාඛා කිහිපයක් අලාභ අවස්ථාවල සමස්ථ බැංකු අංශය ලාභදායි වේ නම් සමස්ථ බැංකු අංශයෙන් ලාභයෙන් ලබාගත හැකි උපරිම දීමනාව සභාපතිවරයාට රු. 15,000.00 ක්ද , උපසභාපතිවරයාට රු 8,000.00ක්ද අනෙකුත් අධ්‍යක්ෂවරයෙකුට රු. 3,000.00 බැගින්ද පමණක් ලබාගත හැකිය .

III. සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛා සංඛ්‍යාව වැඩිවන විට දීමනා ලබාගත හැකි ශාඛා ප්‍රමාණය වැඩිවන නමුත් සමස්ථ බැංකු අංශයේ බැංකු ශාඛා වලින් අලාභ ලබන බැංකු ශාඛා ඇති අවස්ථාකදී , සමස්ථ බැංකු අංශය අලාභයක් වන විට මෙම දීමනා බැංකු අංශය වෙනුවෙන් ලබාගැනීමට හැකියාවක් නොමැත.

IV. ඉහත සඳහන් පරිදි සමිතියේ බැංකු අංශයේ ශුද්ධ ලාභයෙන් බැංකු අංශය විසින් දැරිය යුතු පොදු පරිපාලන වියදම් දායකත්වය සඳහා වන මුදල අඩු කල පසු මෙම දීමනාව ගණනය කල යුතුය.

05.1.2.එක් එක් බැංකු වල අක්‍රිය ණය සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් කල් පසු ණය ප්‍රතිශතය 5% ට අවම මට්ටමේ පවත්වා ගෙන යාමත් , එක් එක් බැංකු ශාඛාවල තැන්පත් මුදල් වලින් අවම වශයෙන් 70% ක් සාමාජිකයින් ණය ලබාදී තිබීමත්, සමිතියේ කාරක නියෝග අනුව ග්‍රාමීය බැංකුවේ අක්‍රිය ගිණුම් සම්බන්ධයෙන් කටයුතු කර තිබීමත්, බැංකු වල අතිරික්තය ආයෝජනය කිරීමේදී විධිමත් නෛතික තත්ත්වයන් මත සිදුකර තිබීමත්, සමිතියේ ණය ලබාදීමට අවශ්‍ය මුදල් වටිනාකම් පුරෝකතනය කරමින් තැන්පත් රැස්කිරීම ප්‍රමාණවත් පරිදි සිදුකිරීමත්, එක් එක් බැංකු ශාඛාවේ සක්‍රිය ගිණුම් නිවැරිදි ලේඛන පවත්වාගනිමින් අවශ්‍ය පිරිස් බලය පරික්ෂාකාරිව පවත්වාගෙන යාමත් කල යුතුය.

05.1.3.බැංකු ශාඛාවේ රැස්කරන මුළු තැන්පත්වලින් සාමාජික නොවන තැන්පත්වල ප්‍රතිශතය 50% හෝ ඊට අඩු මට්ටමකින් පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය.

05.1.4. ග්‍රාමීය බැංකු අංශයේ තැන්පත් සඳහා ගෙවිය යුතු පොලි, කාර්ය රීති අනුව ද ගිවිසගත් පොලී අනුපාත අනුව ද ගණනය කොට තිබිය යුතුය .

## 05. 2. සමිතියේ පාරිභෝගික අංශය

I. සමිතියේ පාරිභෝගික අංශයේ ප්‍රාදේශික, මිනි කෝප් සිටි, කෝප් සිටි, මෙගා කෝප් සිටි වෙන් වෙන්ව ශුද්ධ ලාභදායි විය යුතුය. සමිතියේ පාරිභෝගික අංශයෙන් මාසිකව ලබාගනු ලබන පොදු පරිපාලන වියදම් සඳහා වන කොටස් මුදල අඩුකල පසු විට එම එක් එක් ශාඛාවේ ලාභයෙන් 3% ප්‍රතිශතය වෙන් කර ලබා ගත හැකිය. සමිතියේ ග්‍රාමීය වෙළඳසැල් ජාලය වැඩිවන විට දීමනා ලබාගත හැකි වෙළඳසැල් ප්‍රමාණය වැඩිවන නමුත් සමස්ථ පාරිභෝගික අංශයේ වෙළඳ ජාලයේ අලාභ ලබන ප්‍රාදේශික ඇති අවස්ථාකදී, සමස්ත පාරිභෝගික අංශය අලාභයක් වන විට මෙම දීමනා පාරිභෝගික අංශ වෙනුවෙන් ලබාගැනීමට හැකියාවක් නොමැත.

II. එක් එක් ප්‍රාදේශික, මිනි කෝප් සිටි, කෝප් සිටි, මෙගා කෝප් සිටි වල බඩු අඩු ඇති නොවන ආකාරයෙන් මාසිකව පසු විපරම් කිරිමත්, සමිතියේ සියළු වෙළඳසැල්හි පාරිභෝගික සත්කාරය උපරිම අයුරින් ලබාදෙමින් ජනතාවට අවම මිලට භාණ්ඩ ලබා ගැනීමේ සක්‍රීය යාන්ත්‍රණයක් සකස් කිරිමටත්, නිවැරදි ගිණුම් ක්‍රම හා ලේඛන පවත්වා ගනිමින් දෛනිකව ගිණුම් තුලනය කරවීමත්, මාසික ශුද්ධ ලාභ අලාභ තත්ත්වය පරික්ෂා කිරීමේදි ගිණුම් නිවැරදිව තුලනය කර ඇති බවට පරික්ෂා කරවීමටත්, කටයුතු කල යුතුය. එසේම ණයට විකුණුම් සඳහා ලැබිය යුතු මුදල් ගිවිස ගත් පරිදි නොලැබි කල්පසු විම් වන අවස්ථාවල දී, එසේ ණය වෙළෙඳාමෙහි කල්පසු වූ ණය වටිනාකම වෙළෙඳ ඒකකවල ආංශික අතිරික්ත වලින් අඩු කොට ආංශික ලාභාලාභ ගිණුම් සකස් කල යුතුය.

III. මෙම සියලුම ගිණුම් පිළිගත් ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පැනවීමට වගබලාගත යුතුය.

IV. ඒ අනුව එක් වෙලදසැලක මාසික ශුද්ධ ලාභයෙන් 3% ප්‍රතිශතයක් පහත පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාගැනීමට හැකියාව ඇත .

| සභාපති | උපසභාපති | අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාභිකයන් සඳහා |
|---|---|---|
| 1% | 0.5% | 1.5% |

## 05.3.සමිතියේ ඉන්ධන අංශය

i. සමිතියේ ඉන්ධනහල් වෙන් වෙන්ව ශුද්ධ ලාභදායි විය යුතුය. සමිතියේ ඉන්ධන අංශයෙන් මාසිකව දරනු ලබන පොදු පරිපාලන වියදම් සඳහා වන මුදල අඩුකල විට එම එක් එක් ඉන්ධන අංශයේ ශුද්ධ ලාභයෙන් 3% ප්‍රතිශතය ලබාගැනීමට හැකිය. සමිතියේ ඉන්ධනහල් ප්‍රමාණය වැඩිවන විට දිමනා ලබාගත හැකි ඉන්ධනහල් ප්‍රමාණය වැඩිවන නමුත් ඉන්ධන අංශය අලාභ ලබන අවස්ථාකදී, සමස්ත ඉන්ධන අංශය අලාභයක් වන විට මෙම දිමනා ඉන්ධන අංශ වෙනුවෙන් ලබාගැනීමට හැකියාවක් නොමැත.

ii. එක් එක් ඉන්ධනහල් බඩු අඩු ඇති නොවන ආකාරයෙන් මාසිකව පසු විපරම් කිරිමත්, සමිතියේ ඉන්ධන අංශයේ තැන්පතු මත ණයට විකුණුම් නොපමාව අයකරගැනිමේ යාන්ත්‍රණයක් සකස් කිරිමටත්, නිවැරදි ගිණුම් ක්‍රම හා ලේඛන පවත්වා ගනිමින් දෛනිකව ගිණුම් තුලනය කරවීමත් , මාසික ශුද්ධ ලාභ අලාභ තත්ත්වය පරික්ෂා කිරිමේදි ගිණුම් නිවැරදිව තුලනය කර ඇති බවට පරික්ෂා කරවීමටත්, කටයුතු කල යුතුය. එසේම ණයට

විකුණුම් සඳහා ලැබිය යුතු මුදල් ගිවිස ගත් පරිදි නොලැබී කල්පසු වීම් වන අවස්ථාවල දී, එසේ ණය වෙළෙඳාමෙහි කල් පසු වූ වටිනාකම ආංශික අතිරික්ත වලින් අඩු කොට ආංශික ලාභාලාභ ගිණුමට ගැලපීමෙන් අනතුරුව ගෙවිය යුතු දීමනාව ගණනය කළ යුතු බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

iii. මෙම සියලුම ගිණුම් පිළිගත් ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පැනවීමට වගබලාගත යුතුය.

iv. ඒ අනුව එක් ඉන්ධනහලක මාසික ශුද්ධ ලාභයෙන් 3% ක් පහත පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාගැනීමට හැකියාව ඇත .

| සභාපති | උපසභාපති | අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා |
|---|---|---|
| 1% | 0.5% | 1.5% |

**05.4.** වෙනත් අංශ වල ඒකාබද්ධ ලාභය හෝ අලාභය

**i.** ග්‍රාමීය බැංකු අංශය , පාරිභෝගික අංශය හා ඉන්ධන අංශය හැර සියලු අනෙකුත් අංශ වෙනත් එක් අංශයක් ලෙස සැලකේ. එකී අංශය ශුද්ධ ලාභදායී විය යුතුය. සමිතියේ සියලු අංශ එකාබද්ධ සකස් කරන ගිණුමෙන් මාසිකව දරනු ලබන පොදු පරිපාලන වියදම් සඳහා වන මුදල අඩුකල විට එම වෙනත් අංශවල එකාබද්ධ ශුද්ධ ලාභයෙන් 5% ප්‍රතිශතය ලබාගැනීමට හැකිය. සමිතියේ සමස්ත වෙනත් අංශවල අලාභයක් වන විට මෙම දීමනාව ලබාගැනීමට හැකියාවක් නොමැත.

| සභාපති | උපසභාපති | අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා |
|---|---|---|
| 2.5% | 1% | 1.5% |

**06.1.** ඉහත වගන්ති අනුව ගෙවිය යුතු දීමනාව ගණනය කිරීමේදි සමිතියේ සියළු ආදායම් වියදම් ගිණුම් පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා මා විසින් වරින් වර නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ උපදෙස් වලට අනුව පිළියෙල කොට ආංශික අතිරික්තය/ඌණතා හා ශුද්ධ අතිරික්ත/ඌණතා නිවැරදිව ගණනය කර ඇති බවට සමිතියේ ගණකාධිකාරි සහ සාමාන්‍යාධිකාරි විසින් සහතික කර තිබිය යුතුය.

**06.2.** අදාල වර්ෂයේ ව්‍යවස්ථාපිත විගණනය නිම කරන තෙක් ඉහත සඳහන් අංක 5.1.,5.2.,5.3,හා 05.4 වගන්ති වල සඳහන් සභාපති,උපසභාපති හා අධ්‍යක්ෂවරුන් සඳහා වන සම්පූර්ණ දීමනාව ලබාගැනීමට හිමිකමක් නොමැත. අදාල නියමිත කාලපරිච්ඡේදය තුල අවසාන ගිණුම් සකස් කර විගණය සඳහා ඉහත වගන්ති වල සඳහන් දීමනාවෙන් 75% ලබා ගත හැකි අතර ඉතිරි 25% ක් විගණනය අවසන් කිරීමෙන් පසු ලබා ගැනීමට රඳවා ගැනීමේ ගිණුමකට බැර කල යුතුය.

06.3. එසේ රඳවා ගන්නා දීමනාව ඊළග මුදල් වර්ෂය අවසන් වීම දක්වා රඳවා තැබිය යුතු අතර ඊළගට එළඹෙන මුදල් වර්ෂයේ අවසන් දිනය වන විට විගණනය කර නොමැත්තේ හා නම් දීමනාවට අදාල ගිණුම් වර්ෂය අවසන් වී මාස 3 ක් ඇතුලත මූල්‍ය වාර්තා හා විස්තරාත්මක සටහන් සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක එකී 25% න් 10% ක් සහකාර කොමසාරිස්ගේ අනුමැතිය යටතේ ලබා ගත හැක.

06.4. ඊළගට එළඹෙන මුදල් වර්ෂයේ අවසාන වන විට විගණනය අවසන් කර නොමැත්තේ නම් අදාල රඳවා ගැනිමේ ගිණුමේ තැන්පත් මුදල් ලාභයට ගැලපීම කල යුතුය.

06.5. සෑම මසකටම අදාළ F28 මෙහෙයුම් වාර්තාව සකස් කිරිමෙන් අනතුරුව ලබාගත හැකි දීමනාව ඉහත උපදෙස් පරිදි ගණනය කර, සමිතියේ ගණකාධිකාරිගේ සහතික මත දීමනාව ලබා ගැනීමට පියවර ගන්නා ලෙසද, මොනම හේතුවක් නිසාවත් දීමනාවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීමට පියවර නොගන්නා ලෙසද දන්වමි.

06.6. මෙම චක්‍රලේඛය ඊලඟ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර සාමාන්‍යාධිකාරි ,ගණකාධිකාරි ඇතුළු සමිතියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ කළමනාකරණ මට්ටමේ නිලධාරින් දැනුවත් කිරිමට පියවර ගන්නා ලෙසද වැඩිදුරටත් දන්වමි.

07. මෙම චක්‍රලේඛය සී/ස දූනගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය,සී/ස අත්තනගල්ල, මීරිගම සහ ගම්පහ මැතිවරණ කොට්ඨාශයේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය,සී/ස ගම්පහ සමුපකාර ආරෝග්‍යශාලා සමිතිය,සී/ස මුංවත්ත බටහිර සමුපකාර බැංකු සමිතිය, සී/ස ව්‍යාපාර සංවර්ධන සමුපකාර සමිතිය, සී/ස මීරිගම පේෂකර්ම සමුපකාර සමිතිය, සී/ස මරදගහමුල පේෂකර්ම සමුපකාර සමිතිය, සී/ස වේයන්ගොඩ පේෂකර්ම සමුපකාර සමිතිය, සී/ස බස්නාහිර පළාත් ශ්‍රී ලංකා වෙළඳ නාවිකයන්ගේ සමුපකාර සමිතිය යන සමිති වලටද අදාල වේ.

08. කෙසේ නමුත් සමිතියේ ඒ ඒ අංශ ලාභදායි නොවන කිසිදු අවස්ථාවකදි කිසිදු මුදලක් දිමනාවක් ලෙස ලබාගැනීමට හැකියාවක් නොමැති අතර එම අලාභයට හේතුන් පරික්ෂා කර ඒවා නිවැරදි කිරිම් සිදු කර ගැනිමට අවශ්‍ය ක්‍රමෝපායන් තීරණය කර ක්‍රියාත්මක කිරිම. සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කල යුතුය .

රුවිනි ඒ.විජයවික්‍රම
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත

පිටපත

01.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්- (ගම්පහ/කළුතර/කොළඹ)

දැ.පි. හා සියලුම දෙපාර්මේන්තුවේ නිලධාරින්ට සමිති දැනුවත් කිරිම හා අධික්ෂණය කිරිම සඳහා හා සමිතියේ එෆ් 28 සකස් කිරිම සම්බන්ධයෙන් නිරන්තර පරික්ෂාවන් සිදුකරන ලෙසට සමිති භාර නිලධාරිට උපදෙස් ලබාදීම හා යම් ආකාරයක නිවැරිදි නොවන සියළු එෆ් 28 වාර්ථාව සමිති භාර නිලධාරි විසින් පරික්ෂා කරවීමට හා අධික්ෂණය කිරිම කල යුතුය .